ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

# වී නිෂ්පාදන පිරිවැය
# 1972 යල

## දිස්ත්‍රික්ක පහක වාර්තා තබාගත් ගොවීන්ගෙන් ලබාගත් තොරතුරු මත පදනම් වූ අධ්‍යයනයකි

කේ. ඉසුම්
ඒ. එස්. රණතුංග

පර්යේෂණ අධ්‍යයන මාලා අංක. 1

1973 ජූලි

338.5:
633.18
(SL)
ගොවි.

තැ: පෙ: 1522, කොළඹ.

මිල රු: 4.00

2009/06

2010/04

වී නිෂ්පාදන පිරිවැය

1972 යල

දිස්ත්‍රික්ක පහක වාර්තා තබා ගත්
ගොවීන්ගෙන් ලබා ගත් තොරතුරු මත
පදනම් වූ අධ්‍යයනයකි


ජෝ.ඉසුමි
ඒ.එස්.රණතුංග

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
තැ.පෙ. 1522,
කොළඹ.



22113

පුස්තකාලය
LIBRARY

22113

## පටුන


| | පිටුව |
|---|---|
| හැඳින්වීම ... ... ... ... | 1 |
| අධ්‍යනයෙහි සම්පිණ්ඩනය ... ... ... | 6 |
| සටහන් ලේඛනය ... ... ... | 9 |
| I. කායික ශ්‍රමය, මී හරක් සහ ට්‍රැක්ටර් උපයෝගී කර ගැනීම ... | 10 |
| II. අක්කරයක නිෂ්පාදන පිරිවැය ... ... | 13 |
| III. බුසලක නිෂ්පාදන පිරිවැය සහ අන්තර් දිස්ත්‍රික්ක පිරිවැය – ඵලදා සම්බන්ධතාවය ... ... ... | 16 |
| IV. අක්කරයක් සඳහා අද ගොවීන්ගේ පවුල්වල ගොවි ඉපැයුම් ... | 20 |
| V. වී නිෂ්පාදනයෙහි ශ්‍රම ව්‍යාප්තිය ... ... | 22 |
| උ ප ග්‍ර න් ථ ය ... ... ... | 26 |

## හැඳින්වීම

ගොවීයන් විසින් වගා කරනු ලැබෙන ප්‍රධාන භෝගයන්ගෙන් බොහෝමයක් පිළිබඳ නිෂ්පාදන පිරිවැය දත්ත හිඟයක් දක්නට ලැබේ. ගොවීන් විසින් වගා කරන ලද ආහාර භෝග අතීතයේදී මූලික වශයෙන් යැපීම සඳහා යොදා ගත් නිසා, මෙවැනි දත්ත හිඟයක් තම රාජකාරී කටයුතුවලට බාධාවක් ලෙස ව්‍යාප්ති සේවකයින් විසින් නොසලකන ලදී. කෙසේ වෙතත්, ආහාර ද්‍රව්‍ය ආනයනය සම්බන්ධයෙන් මෑතදී පනවන ලද සීමාවන් නිසා ගොවීහු තම ගොවි කටයුතු තවදුරටත් තමන්ට අවශ්‍ය ආහාර නිපදවා ගැනීමට පමණක් සීමා නොකරයි. ආහාර ද්‍රව්‍ය ආනයනය පිළිබඳව මෑතකදී පැනවූ සීමාවන් නිසා වඩා සූක්ෂම කෘෂිකාර්මික උපක්‍රම ගොවිතැනට යොදා ගැනීම සහ වගා කරන ඉඩම් ප්‍රමාණය වැඩි කිරීම යන ක්‍රම දෙකම උපයෝගී කරගෙන දැනට වගා කරන සම්ප්‍රදායික ආහාර භෝග නිෂ්පාදනය වැඩි කිරීමට ගොවියෝ උනන්දු වූහ. මේ සමඟ ගොවීන්ට උපදෙස් දීම පිළිබඳව කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ගේ කාර්යය, නිෂ්පාදන පිරිවැය හා නිමැවුම් පිළිබඳව මූලික වූත් සවිස්තර වූත් දත්ත නොමැතිකම හේතු කොටගෙන වඩා දුෂ්කර විය. තවද වීවල සහතික මිල ඉතා මෑතක් වනතුරු නොවෙනස්ව තිබූ අතර පසුගිය අවුරුදු කීපයෙහි කෘෂිකාර්මික යෙදවුම්වල මිල සීඝ්‍ර ආකාරයෙන් වැඩි වීම නිසා නිෂ්පාදන පිරිවැය පිළිබඳ දත්ත එකතු කිරීම ඉතා අවශ්‍ය වී ඇත.

අධ්‍යනයෙහි පරමාර්ථ

1. වී නිෂ්පාදනයෙහිදී යොදා ගන්නා ශ්‍රමය, සිවුපා/ට්‍රැක්ටර් බලය සහ අන්‍ය යෙදවුම්වල ප්‍රමාණය සොයා දැන ගැනීම;
2. පවුලේ ශ්‍රමය වඩා සූක්ෂම ලෙස උපයෝගී කර ගැනීමට ඇති ඉඩ කඩ දැන ගැනීම සඳහා මෙහෙයුම් කාරක වශයෙන් වී නිෂ්පාදනයෙහි ශ්‍රම ව්‍යාප්තිය සොයා දැන ගැනීම;
3. විවිධ කෘෂි–දේශගුණික කලාපවල පිහිටා ඇති දිස්ත්‍රික්ක කීපයක, අක්කරයක වපසරියක් වගා කිරීමට යන පිරිවැය හා වී බුසලක් නිෂ්පාදනය කිරීමට යන පිරිවැය සොයා දැන ගැනීම; දිස්ත්‍රික්කයන් අනුව අක්කරයක වී වගා කිරීමට යන වියදම හා වී බුසලක් නිෂ්පාදනය කිරීමේදී යන වියදම්වල වෙනස්වීම් එමගින් දැන ගත හැකිය.
4. ගොවිපලවල වාර්තා තබා ගැනීම පිළිබඳව මූලික පුහුණුවක් ව්‍යාප්ති නිලධාරීන්ට ලබා දීම සහ ගොවිපලෙහි අයවැය ඇස්තමේන්තු ආදිය පිළියෙල කිරීම ඇතුළු කෘෂිකර්ම ආර්ථික සැළසුම් පිළියෙල කිරීමෙහි ලා උපයෝගී විය හැකි යෙදවුම් හා නිමැයුම් පිළිබඳ මූලික දත්ත ඔවුන්ට සපයා දීම.

## අධ්‍යයන ක්‍රමය

පිරිවැය දත්ත එකතු කිරීමේ මූලික පියවරක් වශයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශයේ ද සහයෝගය ඇතිව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් 1972 යල කන්නයේදී වී හා අන්‍ය භෝග කිහිපයක් පිළිබඳව නිෂ්පාදන පිරිවැය අධ්‍යයනයක් කරන ලදී. මෙම ආයතනයෙහි නිෂ්පාදන ආර්ථික අංශය මගින් පිළියෙල කරන ලද ගොවි වාර්තා පොත් උපයෝගී කරගෙන හම්බන්තොට, පොළොන්නරුව, කුරුණෑගල, මහනුවර සහ කොළඹ යන දිස්ත්‍රික්කවල මෙම අධ්‍යයනය සිදු කැරින. ගොවි වාර්තා පොත් උපයෝගී කරගෙන නිෂ්පාදන පිරිවැය පිළිබඳ අධ්‍යයනයක් කිරීම ශ්‍රී ලංකාවෙහි නව ප්‍රවේශයක් වීම හා අධ්‍යනය පටන් ගත් අවධියෙහි ආයතනයෙහි විමර්ශකයන් නොසිටීම නිසා ඉහත සඳහන් දිස්ත්‍රික්කවල කෘෂිකර්ම උපදේශකයන්ගේ සහාය ඇතිව මෙම අධ්‍යයනය ආරම්භ කළේ නියම පරීක්ෂණයක ආකාරයෙනි. ගොවි වාර්තා පොත් නැතිව කන්නයකදී ගොවීන්ගේ ගොවි කටයුතු පිළිබඳ නිවැරදි දත්ත එකතු කිරීම අපිරුය; කලින් කරන ලද ගොවිතැන් කටයුතු පිළිබඳ ගණන් හිලවු ගොවීන් හට අමතක විය හැකි හෙයිනි. මේ නිසා සවිස්තර විස්තර දත්ත එකතු කිරීම සඳහා පරීක්ෂාව යටතේ ගොවි සටහන් පොත් භාවිතා කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කරන ලදී. වාර්තා තබා ගැනීමේ ස්වභාවයත්, විමර්ශකයින්ගේ හිඟයත් නිසා පහත දැක්වෙන කරුණු පදනම් කරගෙන තෝරා ගත් සෑම දිස්ත්‍රික්කයකම සාපේක්ෂ වශයෙන් ගොවි පලවල් ස්වල්පයක් පමණක් මේ සඳහා හඳාරන ලදී.

I. කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථානයට ගොවිපලෙහි ඇති සමීප බව. මේ නිසා අදාළ ව්‍යාප්ති නිලධාරියා හට තමන්ගේ සාමාන්‍ය රාජකාරිවලට බාධා නොවන අන්දමට තෝරා ගත් ගොවිපලවල් සමඟ නිතර සම්බන්ධතා පවත්වා ගැනීමට හැකි වෙයි. ප්‍රදේශයෙහි ව්‍යාප්ති නිලධාරියා අවම වශයෙන් සතියකට දෙවරක්වත් අදාළ සටහන් ක්‍රමානුකූලව ඇතුළත් කිරීමට, සටහන් පොත් තබා ගන්නා ගොවීන් හමු විය.

II. කන්නය පුරාම වී නිෂ්පාදනය පිළිබඳ අදාළ තොරතුරු, තමන් හමු වීමට පැමිණෙන ව්‍යාප්ති නිලධාරීන්ට සැපයීමෙන් මෙවැනි ස්වභාවයේ යෝජනා ක්‍රමයකට සහයෝගය දීමට ගොවීහු දැක්වූ මනාපය.

වාර්තා තබා ගැනීම පිළිබඳව දිස්ත්‍රික්ක පහේම පුහුණු වීමේ පංති මාලාවක් පවත්වන ලදී. ප්‍රථමවරට මෙවැනි අධ්‍යයනයක් කිරීමට යන ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා මෙම පංති මාලා මූලික වශයෙන් අදහස් කෙරින. විවිධ යෙදවුම් පිළිබඳව විස්තරාත්මක සාකච්ඡා මෙම පංති වලදී පවත්වන ලදී. හැකිතාක් නිවැරදිව අදාළ දත්ත ලබා ගැනීමේ පරමාර්ථය සපුරා ගැනීමට දත්ත සටහන් කිරීමේ කාර්ය කෘෂිකර්ම උපදේශකයන්ට පමණක් බාර කරන ලදී. එමගින් ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවකයන් අධ්‍යයන වැඩ සටහනට ඇතුලත්වීම වැළකින. වගා කන්නයෙහිදී කතෘවරු ඒ ඒ දිස්ත්‍රික්කවලට ගොස් ව්‍යාප්ති නිලධාරීන් විසින් තබන ලද සටහන්වල ප්‍රගතිය ක්‍රමවත්ව පරීක්ෂා කළ අතර ව්‍යාප්ති නිලධාරීන් මෙන්ම වාර්තා තබා ගන්නා ගොවීන් ද හමු වී සාකච්ඡා කර අවශ්‍ය උපදෙස් දුන්හ.

## අධ්‍යයනයෙහි සීමාවන්

මුලින් සඳහන් කළ පරිදි, වගා කන්නයක් පුරා දිවෙන වාර්තා තබා ගැනීමේ වැඩ පිළිවෙලෙහි ස්වභාවය නිසා වාර්තා තබා ගන්නාවූ ගොවීන් තෝරා ගැනීම යම් යම් සීමාවන් ඇතුළත කිරීමට සිදු විය. මේ නිසා අනිවාර්යයෙන්ම ගොවි වාර්තා වලින් ලබා ගත් දත්තවල යම් පක්ෂවාදී ස්වභාවයක් පවතී. එහෙත් එම දත්ත ප්‍රයෝජනවත් ලෙස කරුණු කිහිපයකට යොදා ගත හැක. එනම් ගොවිපලෙහි අයවැය හා සැලසුම් කාර්යයන් සඳහා සහ විවිධ ප්‍රමාණයේ බිම් කට්ටිවල සම්පත් උපයෝගීකරණය පිළිබඳ කාර්යක්ෂමතා මිනුම් සඳහා මූලික දත්ත ලෙස, විශේෂයෙන් ව්‍යාප්ති නිලධාරීන්ගේ උපදේශ කටයුතුවලදී ප්‍රයෝජනයට ගත හැකිය. තවද පවුල් ගොවි ඉපැයුම් වැඩි කිරීමේදී ඇති වන ගැටළු සළකා බැලීමට ද මෙවැනි දත්ත ප්‍රයෝජනවත් වෙයි.

මුළු රටටම ගැලපෙන පරිදි වී බුසලක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය සොයා බැලීමට හෝ මිල කිරීමේ ප්‍රතිපත්ති තීරණයන් සඳහා සෑහෙන දත්ත සැපයීමට හෝ මෙම අධ්‍යයනයෙන් කිසිසේත් අදහස් නොකෙරින. මෙම අධ්‍යයනයෙන් එකතු කැරුනු දත්තයන් මූලික වශයෙන් ව්‍යාප්ති නිලධාරීන්ට ප්‍රයෝජනවත් වන අතර, ප්‍රතිපත්ති සකස් කරන්නන්ට වුවද යම් යම් සීමාවන් ඇතුළත මෙම තොරතුරු ප්‍රයෝජනවත් විය හැකි බව අපගේ අදහසයි.

විවිධ කරුණුවල මිල නියම කිරීමේදී පහත සඳහන් පිළිවෙල යොදා ගැනින:-

1. ශ්‍රමය:-

   (අ) <u>කුලී ශ්‍රමය</u> - කුලී ශ්‍රමයට ගෙවූ මිල ගණනය කිරීමේදී ගොවීන් විසින් ඇත්තෙන්ම දරන ලද කුලී ගාස්තු සළකන ලදී. එම වියදම්වලට, කුලී ශ්‍රමිකයන් සඳහා ආහාර පාන සැපයීම පිණිස වාර්තා තබා ගන්නාවූ ගොවීන්ට දැරීමට සිදු වූ වියදම් ද එකතු කරන ලදී.

   (ආ) <u>අත්තම්</u> - මේ ක්‍රමයට ගොවිතැන් කළ අවස්ථාවලදී එම ප්‍රදේශවල කුලී ශ්‍රමිකයන්ට ගෙවන සාමාන්‍ය වැටුප් ප්‍රමාණයන් මිල ගණනය කිරීමේදී යොදා ගන්නා ලදී. මෙම අවස්ථාවලදී ද ආහාර පාන සඳහා ගොවීන්ට දරන්නට සිදු වූ වියදම් තක්සේරු කොට, පිරිවැයට එකතු කරන ලදී.

   (ඇ) <u>පවුල</u> - පවුලේ ශ්‍රමය මිල කිරීමේදී ආවස්ථික වියදම් පිළිබඳ මූල ධර්මය යොදා ගනු නො ලැබීන. ඇත්තෙන්ම ශ්‍රී ලංකාවේ පිටිසර පළාත්වල පවුලේ සාමාජිකයන්ගේ ශ්‍රමයෙහි **ආවස්ථික වියදමක** නැති තරම්ය. යොදා ගන්නා ලද පවුල් ශ්‍රමය මිල කිරීමේදී, අදාළ ගොවීන් විසින් කුලී ශ්‍රමිකයන්ට ගෙවන ලද වැටුප් පරිමාණයන් යොදා ගන්නා ලදී. කෙසේ වෙතත් මෙම ශීර්ෂය යටතේ පවුලේ ශ්‍රමිකයන් විසින් පරිභෝජනය කරන ලද ආහාර පානවල වටිනාකම නොසළකා හැරින; වී වගාවෙහි යෙදුන හෝ නොයෙදුන ද එම වියදම් පවුලේ ශ්‍රමිකයන් විසින් දරනු ලබන හෙයිනි.

II. වී හරක් :-

වී හරක් කුලියට ගත් අවස්ථාවලදී ඒ සඳහා දරන ලද නියම වියදම් මිල කරන ලදී. ගොවියාටම අයිති වී හරක් වී වගා කටයුතුවලට යොදා ගත් විට එම ප්‍රදේශයෙහි අන්‍ය ගොවියන් වී හරක් කුලියට ගන්නා විට ගෙවන සාමාන්‍ය ගාස්තු ප්‍රමාණය වියදම් ගණනය කිරීමට යොදා ගන්නා ලදී.

III. ට්‍රැක්ටර් යන්ත්‍ර :-

ට්‍රැක්ටර් යන්ත්‍ර කුලියට ගත් අවස්ථාවලදී ඒ සඳහා ඒ ඒ ගොවීන් ගෙවන ලද ගාස්තු වියදම් ලෙස සලකන ලදී. ට්‍රැක්ටර් හිමි ගොවීන් එම යන්ත්‍ර භාවිතා කරනවිට ප්‍රාදේශීය ගාස්තු පරිමාන අනුව එම වියදම් ගණන් බලන ලදී.

IV. භාවිතා කළ ද්‍රව්‍ය :-

බීජ වී, පොහොර, රසායනික ද්‍රව්‍ය සහ ගෝනි වැනි ද්‍රව්‍යයන් සඳහා වූ වියදම් ගණනය කිරීමේදී එම ද්‍රව්‍යයන් සැපයුයේ ගොවියා ද ඉඩම් හිමියා ද යන්න නොසලකා දරන ලද නියම වියදම් සලකන ලදී.

V. බිම් කුලිය :-

වාරීතා තබා ගත් ගොවියා අඳ ගොවියකු වී නම් ප්‍රදේශයෙහි පවතින අඳය ගෙවීමේ අනුපාත රටාව අනුව බිම් කුලිය වියදම් ලෙස ගණනය කරන ලදී. අක්කර බද්ද ගෙවන අවස්ථාවලදී එම මුදල ද වියදමට ඇතුළත් කරන ලදී.

VI. ද්‍රව්‍ය වශයෙන් කළ ගෙවීම් :-

ශ්‍රමිකයන්ට, ට්‍රැක්ටර් හිමියන්ට සහ ඉඩම් හිමියන්ට යනාදී වශයෙන් විවිධ පුද්ගලයන්ට ද්‍රව්‍ය වශයෙන් කරන ලද ගෙවීම්වල මිල ගණනය කිරීමට වීවල සහතික මිල පදනම ලෙස යොදා ගන්නා ලදී.

VII. ප්‍රවාහනය :-

යෙදවුම් ගොවිපොළට ගෙන යාමටත් නිමැවුම් ගොවිපොළ වලින් ගෙන ඒමටත් දරන ලද ප්‍රවාහන වියදම් මෙම ගණනයට ඇතුළත් කරන ලදී.

පවත්වාගෙන ගිය ගොවි වාර්තා පොත් සහ චක්‍රගත කිරීමට උපයෝගී කර ගත් වාර්තා පොත් පිළිබඳ විස්තර පහත දැක්වේ:

| | ව්‍යාප්ති නිලධාරීන් විසින් පවත්වාගෙන යන ලද වාර්තා පොත් ගණන | ගො.ප.පු. ආයතනයෙහි චක්‍ර ගත කිරීමට ලැබුණු වාර්තා පොත් ගණන |
|---|---|---|
| හම්බන්තොට | 11 | 9 |
| පොළොන්නරුව | 16 | 16 |
| කුරුණෑගල | 18 | 14 |
| මහනුවර | 24 | 24 |
| කොළඹ | 22 | 22 |
| | 91 | 85 |

## සම්පිණ්ඩනය

1972 යල කන්නයේදී වී නිෂ්පාදන පිරිවැය දත්ත එකතු කිරීමට වාර්තා පොත් 85 ක් දිස්ත්‍රික්ක පහක පවත්වාගෙන යන ලදී. වාර්තා තබා ගන්නා ගොවීන් මූලික වශයෙන් තෝරා ගැනීමේදී යොදා ගන්නා ලද සීමාවන් සලකා, මෙම වාර්තාවේ එකතු කර ඇති දත්ත වලින් සාමාන්‍ය නිගමනයනට එළඹීමට අපේක්ෂා කරනු නො ලැබේ.

වාර්තා තබා ගන්නා ගොවීන්ගෙන් පොළොන්නරුවේ ගොවීහු උපරිම සාමාන්‍ය වපසරියක් වගා කළ ගොවීන් වූ අතර මහනුවර දිස්ත්‍රික්කයේ ගොවීහු අවම සාමාන්‍ය වපසරියක් වගා කළ ගොවීන් වූහ. අස්වැන්න අතින් ද පොළොන්නරුවේ ගොවීහු උපරිම අස්වැන්න ප්‍රමාණය ලබා ගත්හ. අක්කරයක් වගා කිරීමට උපයෝගී කර ගත් ශ්‍රම ප්‍රමාණය හා විවිධ දිස්ත්‍රික්කවලදී ලබා ගන්නා ලද අස්වැන්න ප්‍රමාණයන් අතර සම්බන්ධයක් ඇති බව පෙනේ. වියලි කලාපයෙහි අක්කරයට උපයෝගී කර ගන්නා ලද ට්‍රැක්ටර් දින ගණන, තෙත් කලාපයෙහි අක්කරයකට උපයෝගී කර ගන්නා ලද ට්‍රැක්ටර් දින ගණනට වඩා බොහෝ සෙයින් වැඩිය. අනිත් අතට තෙත් කලාපයේ, මී හරක් යෙදවුම අනුව වූ දින ගණන වියලි කලාපයෙහි ප්‍රමාණයට වඩා වැඩිය. පසුගිය අවුරුදු දහය තුළ කරුණු කිහිපයක් නිසා වියලි කලාපයෙහි දිස්ත්‍රික්කවල මී හරක් බලය භාවිතය සැහෙන පමණ අඩු වී ඇත. උපයෝගී කර ගත් කුලී ශ්‍රමික අනුපාතය දිස්ත්‍රික්ක පහේම සැහෙන පමණ ඉහළය; එම අනුපාතය මහනුවර 63% සිට පොළොන්නරුවේ 85% අතර විචලනය විය. අත්තම් ශ්‍රමය යොදා ගැනීම දිස්ත්‍රික්ක පහේම නොසැළකිය හැකි තරම්ය.

අක්කරයක් සඳහා වන නිෂ්පාදන පිරිවැය දිස්ත්‍රික්ක පහ තුළ පුළුල්ව වෙනස් විය. උපරිම නිෂ්පාදන පිරිවැය පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් ද (රු. 733.05) අවම පිරිවැය හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ද (රු. 532.19)වාර්තා විය. වියදම් අතරින් ශ්‍රමය සඳහා වූ වියදම ප්‍රධාන කාරණය විය. මුළු පිරිවැයෙන්, ශ්‍රම පිරිවැය සියයට 51 (හම්බන්තොට දිස්ත්‍රික්කය) සිට සියයට 69 (මහනුවර දිස්ත්‍රික්කය) දක්වා වෙනස් විය. විවිධ දිස්ත්‍රික්කවල සම්පත් භාවිත රටාවල සැළකිය යුතු වෙනස්කම් දක්නට ලැබින. වැඩි අස්වැන්නක් ලබන පොළොන්නරුව හා මහනුවර යන දිස්ත්‍රික්ක දෙකෙහි අක්කරයක් වගා කිරීමට උපයෝගී කර ගන්නා ලද මිනිස් දින ප්‍රමාණයන් සැහෙන පමණ එකිනෙකින් වෙනස් වෙයි. පොළොන්නරුවට වඩා මහනුවර දිස්ත්‍රික්කයෙහි වැඩිපුර මිනිස් දින විසි පහක් උපයෝගී කරගෙන ඇත.; පවුලේ ශ්‍රමය වැඩිපුර යොදා ගැනීම මීට ප්‍රධාන හේතුවයි. අනික් අතට පොළොන්නරුව දිස්ත්‍රික්කයෙහි උපයෝගී කර ගන්නා ලද ට්‍රැක්ටර් දින ගණන මහනුවර දින ගණන මෙන් හරියටම දෙගුණයකි. මෙම දිස්ත්‍රික්ක දෙකෙහි ගොවියන් විසින් අක්කරයකට ලබා ගන්නා ලද ලාභ ආන්තිකයන් බොහෝසෙයින් එක සමාන වුවද මහනුවර ගොවි පවුලක් අක්කරයකින් ඉපැයූ ප්‍රමාණය පොළොන්නරුවේ පවුලක ඉපැයුමට වඩා වැඩිය. මෙයට හේතුව මහනුවර ගොවීහු පවුලේ ශ්‍රමය වඩා සූක්ෂම ලෙස උපයෝගී කර ගැනීමය.

පොළොන්නරුව සහ හම්බන්තොට වගා පිළිවෙත් සලකා බලනවිට වාර්තා තබාගත් සියළුම ගොවියෝ පොහොර භාවිත කොට තිබුනි. එහෙත් භාවිතා කළ ප්‍රමාණය පොළොන්නරුව වැනි ඉතා ඉහළ අස්වැන්නක් ලබන දිස්ත්‍රික්කයක පවා සම්මත ප්‍රමාණයන්ට වඩා අඩු විය.

පොහොර පරිභෝජනය අතින් කුරුණෑගල අවම මට්ටමක විය. මහනුවර හැර අන්‍ය දිස්ත්‍රික්කවල පොදු වගා ක්‍රමය වූයේ කෙළින්ම වැපිරීමයි. මහනුවර වාර්තා තබා ගත් ගොවීන්ගෙන් සියයට 90 කට වැඩි පිරිසක් ගොයම් පැළ ගලවා යළි සිටවූහ. දිස්ත්‍රික්ක පහේම භාවිතා කරන ලද යෙදවුම් අතරින් ඉතාමත් මිල වැඩි යෙදවුම පොහොර විය. වී බුසලක් නිෂ්පාදනය කිරීමට යන වියදම පොළොන්නරුවේ රු. 9.67 සිට හම්බන්තොට රු. 14.43 දක්වා විචලනය විය. අපේක්ෂිත ලෙසම අක්කරයකට ලැබෙන අස්වැන්න සහ වී බුසලක නිෂ්පාදන පිරිවැය අතර සෘජු සම්බන්ධතාවයක් විය. පහත දැක්වෙන පරිදි දිස්ත්‍රික්ක පහේ වී බුසලක නිෂ්පාදන පිරිවැය සහ අක්කරයකින් ලද වී අස්වැන්න භාවිත කොට අන්තර් දිස්ත්‍රික්ක පිරිවැය ශ්‍රිතයක් නිෂ්පන්න කැරිණ.

$$\text{වී} = 17.929 - 0.112\ \text{අ}$$
$$(0.023)\quad (r^2 = 0.891)$$

නියමිත අස්වැන්නකට අනුරූප ලෙස වී බුසලක පිරිවැය තක්සේරු කිරීමට මෙම ශ්‍රිතය භාවිතා කරන ලදී. දිස්ත්‍රික්ක පහේම වාර්තා පොත්වල සඳහන් නියම වියදම් සහ තක්සේරු වියදම අතර වෙනස සෑහෙන පමණ සුළු විය. 1972 යල කන්නයේදී, අක්කරයකට ලැබුණු අස්වැන්න බුසල් 35ක් වූ විට වී බුසලක නිෂ්පාදන පිරිවැය රු. 14.00 ක් විය.

වාර්තා තබා ගත් සියළුම ගොවීන් අඳ ගොවීන්ය යන උපකල්පනයෙහි පිහිටා ගොවි පවුලේ ඉපැයීම් ද තක්සේරු කරන ලදී. වියලි කලාපයේ අඳ ගොවියෝ සාමාන්‍යයෙන් භෝග අස්වැන්නෙන් සියයට 25 ක් බිම් කුලිය ලෙස ඉඩම් අයිතිකරුවන්ට ගෙවති. තෙත් කලාපයේ දිස්ත්‍රික්ක බොහොමයක බිම් කුලිය භෝග අස්වැන්නෙන් සියයට 50 කි. මෙම පදනම මත බිම් කුලිය අන්‍ය වගා වියදම්වලට එකතු කළ විට පොළොන්නරුවේ හැර අන්‍ය දිස්ත්‍රික්කවල පවුල්වල ගොවි ඉපැයුම් සෘන තත්වයකට පත් වන බවක් පෙනින. අඳේ හා බදු විධිමත් කිරීම් සඳහා අරි එවත් පියවර ගැනීම සඳහා ඇති හදිසි අවශ්‍යතාවය මෙම තැබුරුතාවයෙන් ප්‍රත්‍යක්ෂ වේ. මෙහෙයුම්කාරක වශයෙන් ශ්‍රම ව්‍යාප්තිය විශ්ලේෂණය කරන විට, ශ්‍රම තීව්‍රතාව වඩාත් අධික වන්නේ වැඩ අධික කාලපරිච්ඡේද දෙකකදී බව එළිදරව් වෙයි. එනම් (1) බිම සකස් කිරීම හා වැපිරීම (2) අස්වැන්න කපා ගැනීම හා පාගා ගැනීම යන කාල පරිච්ඡේදය දෙකෙහිය. වගාව සඳහා උපයෝගී කරගත් මුළු ශ්‍රමයෙහි අනුපාතයෙන්, බිම සකස් කිරීමටත් අස්වැන්න කපා ගැනීමටත් උපයෝගී කර ගත් ශ්‍රම අනුපාත දෙකෙහි එකතුව සියයට 76 (කුරුණෑගල) සිට සියයට 83 (මහනුවර) දක්වා විචලනය විය. වී නිෂ්පාදන යෙහි ශ්‍රම ව්‍යාප්ති රටාව දෙස දළ ලෙස බලනවිට සංවර්ධනය වූ රටවල රටාවට ඇති සමානත්වයක් පෙනී යයි. ශ්‍රී ලංකාවෙහි වී නිෂ්පාදන ශිල්ප ක්‍රම බොහෝ සෙයින් ආනයනය කරන ලද යෙදවුම් මත රඳා පවතී. මේ නිසා සෑහෙන පමණ විදේශ විනිමය නොමැති කමින් යෙදවුම් ආනයනය සීමා කැරුණු විට කුඹුරුවල නිෂ්පාදනය සෑහෙන පමණ උසස් මට්ටමක තබා ගැනීම ප්‍රශ්නයක් වෙයි. මෙසේ පුද්ගලික ගොවියාගේ දෘෂ්ටි කෝණයෙන් බලන කල හැකිතාක් පවුලේ ශ්‍රමය හා දේශීය යෙදවුම් උපයෝගී කරගෙන ගොවිතැන් කරන ක්‍රමයකට හුරුවීම ගොවි පවුලේ ඉපැයුම් වැඩි කර ගැනීමට අතිශයින් වැදගත් වෙයි. මෙවැනි ආකල්පයක්, මේ රටේ වී නිෂ්පාදන අංශය යළි ප්‍රබෝධමත් කිරීමට උදව් වනු ඇත.

## අපේ ස්තූතිය

මෙම ප්‍රයත්නයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි ව්‍යාප්ති අංශය මහත් ඕනෑකමින් සැපයූ ආධාරය කෘතඥ පූර්වකව සඳහන් කරමු. කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂක (ව්‍යාප්ති) ආචාර්ය ර්.අබේරත්න, දිස්ත්‍රික්ක කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී ජේ.වික්‍රමරත්න, හම්බන්තොට සී.බී.අළුවිහාරෙ, පොළොන්නරුව, ර්.ඇම්.අබේරත්න, මහනුවර, පී.එස්.එන්.සී. විජේවර්ණසූරිය, කොළඹ, ඩබ්.අබේවර්ණ, කුරුණෑගල යන මහතුන්ටද; විශේෂ ව්‍යාපාර කළමනාකරු ඩබ්.රත්නායක, හිඟුරක්ගොඩ, පී.වී.ගුණවර්ධන, මීනිපේ යන මහතුන්ට ද ඉහත සඳහන් කල දිස්ත්‍රික්කවල නිෂ්පාදන පිරිවැය වාර්තා අප වෙනුවෙන් රැස් කල කෘෂිකර්ම උපදේශකවරුන්ට ද අපේ විශේෂ ස්තූතිය හිමි වෙයි. මෙම අධ්‍යනය කිරීමේදී අපට නන් අයුරින් උපදෙස් දුන් සහ අප ධෛර්යමත් කල ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂක සී.නාරායනසාමි සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ප්‍රධාන උපදේශක ෆ්‍රෑන්ක් සෝන්ඩර්ස් යන මහතුන්ට ද අපගේ ස්තූතිය හිමි වෙයි.

## ස ට හ න් ලේ ඛ න ය


| | | | |
|---|---|---|---|
| | | | පිටුව |
| සටහන් | I – 1 | ගොවිපලේ ප්‍රමාණය සහ අක්කරයක අස්වැන්න ... | 10 |
| සටහන් | I – 2 | වැඩ කරන ලද දින ගණන, කායික ශ්‍රමය මී හරක් සහ ට්‍රැක්ටර් යන්ත්‍ර ... ... | 10 |
| සටහන් | I – 3 | මුළු ශ්‍රමයෙන්, කුලී සහ පවුල් ශ්‍රම ප්‍රමාණයන්ගේ අනුපාත | 12 |
| සටහන් | II – 1 | අක්කරයක නිෂ්පාදන පිරිවැය (රුපියල්) ... | 13 |
| සටහන් | II – 2 | අක්කරයක ලාභ ආන්තිකයන් සහ ගොවි පවුලේ ඉපැයුම් (රුපියල්) ... ... | 14 |
| සටහන් | II – 3 | දිස්ත්‍රික්ක පහේ වාර්තා තබාගත් ගොවීන් අනුගමනය කළ වගා පිළිවෙත් ... ... | 15 |
| සටහන් | II – 4 | අක්කරයකට යොදන ලද යෙදවුම්වල පිරිවැය සංරචකයන් (රුපියල්) ... ... | 16 |
| සටහන් | III – 1 | වී බුසලක නිෂ්පාදන පිරිවැය (රුපියල්) ... | 17 |
| සටහන් | III – 2 | නිෂ්පන්න සමීකරණයෙන් ගක්සේරු කරන ලද වී බුසලක පිරිවැය ... ... | 18 |
| සටහන් | III – 3 | වී බුසලක් නිෂ්පාදනය කිරීම සඳහා උපයෝගී කරගත් යෙදවුම් ද්‍රව්‍යවල පිරිවැය සංරචකයන් (රුපියල්) | 19 |
| සටහන් | IV – 1 | අක්කරයක් සඳහා අඳ ගොවීන්ගේ පවුල්වල ගොවි ඉපැයුම් ... ... | 21 |
| සටහන් | V – 1 | අක්කරයක් සඳහා මෙහෙයුම් කාරක වශයෙන් ශ්‍රම ව්‍යාප්තිය ... ... | 23 |
| සටහන් | V – 2 | අක්කරයක් සඳහා උපයෝගී කර ගත් මුළු ශ්‍රමය හා ප්‍රධාන ක්ෂේත්‍ර කාර්යයන් සඳහා උපයෝගී කර ගත් ශ්‍රම ප්‍රමාණවල අනුපාතය ... | 24 |

කායික ශ්‍රමය මී හරක් සහ ට්‍රැක්ටර් උපයෝගී කර ගැනීම:

අක්කරයක් සඳහා ට්‍රැක්ටර්, මී හරක් සහ කායික ශ්‍රමය යොදා වැඩ කරන ශ්‍රමිකයන්ගේ වැඩ දින ගණන තක්සේරු කිරීමට පෙර, වාරිතා තබා ගත් ගොවීන් අක්කරයකට ලබා ගත් සාමාන්‍ය වී අස්වැන්න හා ඔවුන් සතුව ඇති කුඹුරු කට්ටිවල සාමාන්‍ය ප්‍රමාණයන් නිමානය කරන ලදී. (සටහන් 1-1) වාරිතා තබා ගත් ගොවියන්ගෙන් පොළොන්නරුවේ ගොවියෝ වැඩි සාමාන්‍ය අක්කර ප්‍රමාණයක් 1972 යල කන්නයේදී වගා කළ අතර මහනුවර ගොවියෝ අවම සාමාන්‍ය අක්කර ප්‍රමාණයක් වගා කළහ. තවද අක්කරයකට වැඩිම සාමාන්‍ය අස්වැන්න පොළොන්නරුවේ ගොවියෝ ලබා ගත් අතර හම්බන්තොට ගොවියෝ අවම සාමාන්‍ය අස්වැන්න ලබා ගත්හ.

සටහන් 1-1 <u>ගොවිපලේ ප්‍රමාණය සහ අක්කරයක අස්වැන්න, 1972 යල</u>

| | වක්‍ර ගත කිරීමට උපයෝගී කර ගන්නා ලද වාරිතා තබා ගත් ගොවීන්ගේ ගණන | කුඹුරකින් වපුරන ලද වපසරියේ සාමාන්‍ය අක්කර ගණන | කුඹුරින් යලට කපා ගත් සාමාන්‍ය වී බුසල් ගණන | අක්කරයකට ලැබුණු සාමාන්‍ය වී බුසල් ගණන |
|---|---|---|---|---|
| හම්බන්තොට | 9 | 2.88 | 106.1 | 36.9 |
| පොළොන්නරුව | 16 | 4.09 | 310.0 | 75.8 |
| කුරුණෑගල | 14 | 3.54 | 176.5 | 49.9 |
| මහනුවර | 24 | 1.31 | 93.8 | 71.7 |
| කොළඹ | 22 | 1.44 | 66.4 | 46.1 |

මෙම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලද දිස්ත්‍රික්ක පහ කෘෂි-දේශගුණික තත්වයන් අනුව වෙනස් වුවද, පහත දැක්වෙන ප්‍රවණතාවය එම දිස්ත්‍රික්ක පහේම දක්නට ලැබුණි. (සටහන 1-2) සාමාන්‍යයෙන් අක්කරයකට වැඩි අස්වැන්නක් ලබන දිස්ත්‍රික්කවල අක්කරයකට උපයෝගී කරගත් ශ්‍රම ප්‍රමාණය, අඩු අක්කර අස්වැන්නක් ලබන දිස්ත්‍රික්කවලට වඩා වැඩි බව පෙනේ. අක්කරයක් වගා කිරීමට උපයෝගී කරගත් ශ්‍රම ප්‍රමාණය සහ වාරිතා තබා ගත් ගොවීන් විසින් ලබා ගත් අස්වැන්න ප්‍රමාණය අතර සම්බන්ධයක් ඇති බව පෙනේ.

සටහන 1 - 2 වැඩ කරන ලද දින ගණන - කායික ශ්‍රමය - මී හරක් සහ ට්‍රැක්ටර් යන්ත්‍ර

| | අක්කරයක වැඩට යොදා ගත් කායික ශ්‍රම දින ගණන 1/ | | | | අක්කරයකට මී හරක් යෙදවුම් අනුව දින ගණන 2/ | අක්කරයකට ට්‍රැක්ටර් දින ගණන 2/ | අක්කරයකට ලැබූ වී අස්වැන්න බුසල් |
|---|---|---|---|---|---|---|---|
| | කුලී ශ්‍රමය | අත්තන් ශ්‍රමය | පවුලේ ශ්‍රමය | එකතුව | | | |
| හම්බන්තොට | 30.7 | 1.0 | 8.9 | 40.6 | 0.6 | 2.0 | 36.9 |
| පොළොන්නරුව | 57.9 | 0.1 | 10.0 | 68.0 | 3.4 | 1.2 | 75.8 |
| කුරුණෑගල | 54.4 | 1.8 | 8.2 | 64.4 | 2.7 | 0.9 | 49.9 |
| මහනුවර | 58.8 | 6.1 | 28.2 | 93.1 | 5.9 | 0.6 | 71.7 |
| කොළඹ | 37.7 | 1.3 | 16.3 | 55.3 | 6.0 | 0.6 | 46.1 |

සටහන්: 1/ මී හරක් සහ ට්‍රැක්ටර් රියදුරන් – කුලියට හෝ අත්තන් හෝ පවුල් ශ්‍රමික විසින් වැඩ කරන ලද දින ගණන ද ඇතුළත්ය.

සටහන්: 2/ බිම සකස් කිරීමට හා වී පෑගීමට වැය වූ දින ගණන ද ඇතුළත්ය.

හම්බන්තොට හා පොළොන්නරුවේ වාර්තා තබා ගත් ගොවීන් විසින් අක්කරයකට උපයෝගී කර ගන්නා ලද ට්‍රැක්ටර් දින ගණන අනික් දිස්ත්‍රික්ක තුනෙහි උපයෝගී කරගත් දින ගණනට වඩා සාරානුකූලව වැඩි වේ. හම්බන්තොට ගොවීන් විසින් වැඩිම ට්‍රැක්ටර් දින ගණනක් උපයෝගී කරගත් අතර එම දින ගණන පොළොන්නරුවේ ට්‍රැක්ටර් දින ගණන මෙන් දෙගුණයක් පමණ වෙයි. මෙයට එක හේතුවක් නම් හම්බන්තොට ගොවීහු රෝද දෙකේ ට්‍රැක්ටර් යන්ත්‍ර පෑවුල වශයෙන් භාවිතා කිරීම හා පොළොන්නරුවේ ගොවීහු රෝද හතරේ ට්‍රැක්ටර්වලට කැමති වීමය. අක්කරයකට උපයෝගී කර ගන්නා ලද ට්‍රැක්ටර් දින ගණන සහ වියළි කලාපයේ ගොවීන් විසින් වපුරන ලද සාමාන්‍ය බිම් ප්‍රමාණය අතර යම්කිසි සම්බන්ධතාවයක් නො පෙනේ. අනික් අතට දිස්ත්‍රික්ක පහෙන් මී හරක් යෙදවුම් අනුව වූ අවම දින ගණනක් උපයෝගී කරගෙන ඇත්තේ හම්බන්තොට දිස්ත්‍රික්කයෙහිය. හම්බන්තොට දිස්ත්‍රික්කයේ අක්කරයකට මී හරක් යෙදවුම් අනුව වූ දින ගණන 0.6 ක් වූ අතර පොළොන්නරුවේ 3.4 ක් සහ කුරුණෑගල 2.7 ක් විය. මේ දිස්ත්‍රික්ක දෙකෙහි වගා කරන ලද කුඹුරක සාමාන්‍ය විශාලත්වය හම්බන්තොට එවැනි ප්‍රමාණයට වඩා විශාලය. (සටහන් 1–1) හම්බන්තොට දිස්ත්‍රික්කයේ බොහෝ ගොයම් බිම් සකස් කිරීම හා පෑගීම සඳහා ට්‍රැක්ටර් භාවිතා කර ඇති අතර පොළොන්නරුවේ සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල බිම් සකස් කිරීම සඳහා ට්‍රැක්ටර් හා මී හරකුන් උපයෝගී කරගෙන තිබෙන බව ඉහත දැක්වෙන දත්ත වලින් ද (සටහන් 1–2) පෙන්වා දෙයි. තෙත් කලාපයේ පිහිටි මහනුවර සහ කොළඹ දිස්ත්‍රික්කවල අක්කරයක් සඳහා මී හරක් යෙදවුම අනුව වූ දින ගණන වියළි කලාපයේ දිස්ත්‍රික්කවල උපයෝගී කර ගත් ගණන මෙන් දෙගුණයක් විය.

සාමාන්‍යයෙන් වියළි කලාපයේ දිස්ත්‍රික්කවල ඇල මාර්ග සඳහා රජයෙන් වෙන් කර ඇති බිම්, මුඩු බිම් සහ කැලෑවල අනවසරයෙන් පදිංචි වීම, බහුල වශයෙන් සිදු වීම නිසා විශේෂයෙන් ජලය ද හිඟ වන යල කන්නයේදී සතුන්ට තෘණ බිම් ඉඩ කඩ සොයා ගැනීමේ උග්‍ර ප්‍රශ්නයට වී ගොවීන්ට මුහුණ පෑමට සිදු වී ඇත. මේ නිසා අවුරුදු ගණනාවක් ඔස්සේ වියළි කලාපයේ මී හරක් සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වී ගොස් ඇත. මේ තත්වය තවත් උග්‍ර කළ කරුණක් ඇත. එක් දහස් නමසිය පනස් ගණන්වල කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින්, වියළි කලාපයේ ගොවීන්ට ට්‍රැක්ටර් කුලියට සැපයීමේ මධ්‍යස්ථාන කිහිපයක් ආරම්භ කරනු ලැබීම මේ කරුණයි. තවද අතීතයේ යොදා ගන්නා ලද ප්‍රතිපත්තීන්; එනම් අධික තක්සේරු ගාස්තු ප්‍රමාණ යටතේ ට්‍රැක්ටර් සහ අනෙකුත් සම්බන්ධිත මෙවලම් ගෙන්වීම පිළිබඳ ප්‍රතිපත්තීන් නිසා තරඟකාරී ගාස්තු යටතේ ගොවියන්ට ට්‍රැක්ටර් සේවා ලබා දීමට ඉඩම් හිමියන්ට මෙන්ම ව්‍යාපාරිකයන්ට ද ඉඩ ප්‍රස්ථා ලැබිණ. වියළි කලාපයෙහි බොහෝ ප්‍රදේශවල වී කුඹුරු වලින් මී හරකුන්, කොන්වීම මෙසේ සිදු විය. හම්බන්තොට ප්‍රදේශය මේ සම්බන්ධයෙන් ඉතා වැදගත්ය.

සටහන් 1-3 **මුළු ශ්‍රමයෙන් කුලී සහ පවුල් ශ්‍රම ප්‍රමාණයන්ගේ අනුපාත**

| | මුළු ශ්‍රමයෙන් කුලී ශ්‍රමයෙහි % | මුළු ශ්‍රමයෙන් පවුල් හා අත්තම් ශ්‍රමයෙහි % | එකතුව |
|---|---|---|---|
| හම්බන්තොට | 75.6 | 24.4 | 100.0 |
| පොළොන්නරුව | 85.1 | 14.9 | 100.0 |
| කුරුණෑගල | 85.5 | 14.5 | 100.0 |
| මහනුවර | 63.2 | 36.8 | 100.0 |
| කොළඹ | 68.2 | 31.8 | 100.0 |

පොළොන්නරුව හා හම්බන්තොට යොදා ගන්නා ලද මුළු යෙදවුම් වලින් සියයට 85 ක් පමණ වූ අධික කොටසක් කුලියට යොදා ගත් ශ්‍රමය විය. කුඩා බිම් කට්ටි සුලභව ඇති මහනුවර පවා කුලියට යොදා ගත් ශ්‍රමයෙහි අනුපාතය සියයට 60 කටත් වැඩි විය. මුළු ශ්‍රමයෙන් ප්‍රතිශතයක් වශයෙන් ඉහළ අනුපාතයක් කුලී ශ්‍රමයට අයත් වීමට විශේෂයෙන් වියළි කලාපයෙහි වැදගත් කරුණු කිහිපයක් මෙසේ පෙළියෙන් දැක්විය හැක.

1. බොහෝවිට ඉඩම් හිමියන්ට හා ව්‍යාපාරිකයින්ට අයිති යන්ත්‍ර උපකරණ මගින් බිම සකස් කිරීම සහ වී පෑගීම කර ගැනීමට ගොවියෝ මහත් සේ ඉඩම් හිමියන්ගේ හා ව්‍යාපාරිකයන්ගේ යන්ත්‍ර උපකරණ අපේක්ෂා කිරීම. මෙම අපේක්ෂාව, අක්කරයකට උපයෝගී කර ගන්නා මුළු ශ්‍රම ප්‍රමාණයේ කුලී ශ්‍රම සංචරකය වැඩි කොට ඇත.

2. 1960 ගණන්වල මුල් කාලයෙහි වියළි කලාපය පුරා එච්-4 නම් වී වර්ගය සීඝ්‍රයෙන් පැතිර යාම, ගොවිතැන සඳහා කුලී ශ්‍රමය උපයෝගී කර ගැනීම පුළුල් කිරීමට සාධක වූ එක කරුණකි. එච්-4 වී ඇට වැටීමේ ස්වභාවය ඉතා අඩු නිසා ගොවීහු ගොයම් පාගා ගැනීමට බහුල වශයෙන් ට්‍රැක්ටර් යන්ත්‍ර උපයෝගී කර ගැනීමට පටන් ගත්හ. කමත් බොහොමයකින් මී ගරක් ක්‍රමයෙන් මෙසේ කොත් විති. මධ්‍යස්ථ ප්‍රමාණයෙන් පොහොර යෙදූ අවස්ථාවලදී පවා මෙම වී වර්ගයේ ගොයම් මහත් සේ බිම වැතිරෙන ස්වභාවය නිසා ඉක්මනින් අස්වැන්න කපා ගැනීම අවශ්‍ය කරවයි. සම්ප්‍රදායික වී වර්ගවල පවා ගොයම් බිම වැතිරීම ප්‍රධාන ගැටළුවකි; අස්වැන්න කපා ගැනීමට කුලී ශ්‍රමය වැඩිපුර යොදා ගැනීමට මෙම කරුණ ද එක හේතුවකි.

3. ග්‍රාමීය ප්‍රදේශවල සම්ප්‍රදායික ව්‍යා පිළිවෙතක් වූ අත්තම් ශ්‍රමය යොදා ගැනීම [illegible] ගණනාවක සිට ක්‍රමයෙන් අඩු වීගෙන යයි. තෙත් කලාපයේ දිස්ත්‍රික්කයක් වූ මහනුවර පවා අත්තම් ශ්‍රමය උපයෝගී කරගෙන ඇත්තේ ඉතා සුළු වශයෙනි. (සටහන 1-2) වියළි කලාපයෙහි උපයෝගී කර ගන්නා ලද අත්තම් ශ්‍රමය නොසළකා හැරිය හැකි තරම්ය. සමහර පර්යේෂකයන් විසින් මීට පෙර අත්තම් ශ්‍රමය පිළිබඳව ඉදිරිපත් කරන ලද උපකල්පනයන් වර්තමානයෙහි එතරම් වලංගු නොවන බව මෙයින් පෙනී යයි.

4. වල් නෙලීම සහ බෙහෙත් ද්‍රව්‍ය ඉසීම වැනි වගාවන් අතර වූ කෘෂිකාර්මික කාර්යයන් චාරිත්‍ර තබා ගත් ගොවීන් විසින් ඉෂුණ කරන ල්ද්දේ ඉතාමත් අඩු වශයෙනි. මේවා කළ අවස්ථාවලදී ඒ සඳහා කුලී ශ්‍රමය යොදා ගන්නා ලදී; ඉතා කුඩා බිම් කට්ටිවල හැරුණුවිට පවුල් ශ්‍රමය මේ සඳහා උපයෝගී කර ගත්තේ කලාතුරකිනි.

5. වියළි කලාපයෙහි ජනගහණය ව්‍යාප්තිය අඩුවීම, සාපේක්ෂ වශයෙන් බිම් කට්ටි විශාල වීම සහ කෘෂිකාර්මික කාර්යයන් සඳහා ලැබෙන කාල වේලාව සීමිතවීම ආදි කරුණු නිසා වාර්ය බහුල කාල පරිච්ඡේදවල පවුල් ශ්‍රමය අවශ්‍ය ශ්‍රම ප්‍රමාණය සැපයීමට තරම් නොසෑහෙයි. මේ නිසා අන්‍ය ප්‍රදේශවලින් සංක්‍රමණය වන ශ්‍රමිකයන්ගේ ශ්‍රමය ලබා ගැනීමට ගොවීන්ට සිදු වෙයි.

6. පසුගිය දශක දෙක තුළදී ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපන පහසුකම් ව්‍යාප්ත වීම නිසා ගොවි කටයුතු වලින් බැහැර වී නාගරික ප්‍රදේශවලට සංක්‍රමණය කිරීමට අභිප්‍රාය අධ්‍යාපනය ලත් ගැමි තරුණයෝ පෙළඹීම නිසා කුලී ශ්‍රමය මත වැඩි වැඩියෙන් යැපීමට ගොවීන්ට සිදු වීම තවත් හේතුවකි.

## II අක්කරයක නිෂ්පාදන පිරිවැය

අධ්‍යයනයෙහි අඩංගු වූයේ ගොවීන් සුළු ගණනක් හෙයින්, අක්කරයක නිෂ්පාදන පිරිවැය තක්සේරු කිරීමේදී චාරිත්‍ර තබාගත් සියළුම ගොවීන් ඉඩම් අයිතිකාරකයන් ලෙස සලකනු ලැබේ. එවැනි විශ්ලේෂණයක් එතරම් වැදගත් නොවෙතියි සැළකූ නිසා ඉඩම් අයිති ගොවියන් සහ අඳේ ගොවියන් යන පදනම මත නිෂ්පාදන පිරිවැය වර්ග කිරීමට උත්සාහයක් නො ගන්නා ලදී.

සටහන් II-I අක්කරයක නිෂ්පාදන පිරිවැය (රුපියල්)

| | ශ්‍රමය | | | | මී හරක් | ට්‍රැක්ටර් | | අක්කරයක මුළු |
|---|---|---|---|---|---|---|---|---|
| | කුලී ශ්‍රම | අත්තන් | පවුලේ | මුළු ශ්‍රම | දින | දින | උපකරණ | පිරිවැය |
| | රු. | ශ්‍රම රු. | ශ්‍රම රු. | රු. | රු. | රු. | රු. | රු. |
| හම්බන්තොට | 230.40 | 4.41 | 37.42 | 272.23 | 5.44 | 118.33 | 136.19 | 532.19 |
| % | (43.3) | (0.8) | (7.0) | (51.1) | (1.0) | (22.2) | (25.7) | (100.0) |
| පොළොන්නරුව | 352.03 | 0.86 | 50.16 | 403.05 | 34.32 | 150.07 | 145.61 | 733.05 |
| % | (48.0) | (0.1) | (6.8) | (54.9) | (4.7) | (20.5) | (19.9) | (100.0) |
| කුරුණෑගල | 356.58 | 10.02 | 37.71 | 404.31 | 23.80 | 98.03 | 104.43 | 630.57 |
| % | (56.5) | (1.6) | (6.0) | (64.1) | (3.8) | (15.5) | (16.6) | (100.0) |
| මහනුවර | 332.57 | 42.61 | 108.04 | 483.22 | 61.33 | 50.85 | 106.81 | 702.21 |
| % | (47.4) | (6.1) | (15.4) | (68.9) | (8.7) | (7.2) | (15.2) | (100.0) |
| කොළඹ | 242.89 | 11.67 | 67.60 | 322.16 | 40.21 | 58.49 | 115.00 | 535.86 |
| % | (45.3) | (2.2) | (12.6) | (60.1) | (7.5) | (10.9) | (21.5) | (100.0) |

පුස්තකාලය
LIBRARY
මෙ.ලෙ. ... KTI

22113

අක්කරයකට උපරිම නිෂ්පාදන පිරිවැය සහ උපරිම ඵලදාව පොළොන්නරුවෙන් ද අක්කරයකට අවම නිෂ්පාදන පිරිවැය සහ අවම ඵලදාව හම්බන්තොටින් ද විය. සටහන් II-1 සහ I-1 වල දත්ත වලින් එළිදරව් වන පරිදි දිස්ත්‍රික්ක පහේම අක්කරයක ඵලදාව චලනය වන අතටම අක්කරයක නිෂ්පාදන පිරිවැය ද චලනය වේ. වියදම් වලින් වැඩිම කාරණය ශ්‍රම පිරිවැය විය. එය හම්බන්තොට සියයට 51 සිට මහනුවර සියයට 69 අතර විචලනය විය. කෘෂි-දේශගුණික තත්වයන් මෙන්ම ගොවීන්ගේ සමාජ-ආර්ථික තත්වයන් ද පුළුල් ලෙස වෙනස් වන, වැඩි අස්වැන්න ප්‍රමාණයන් ලබන දිස්ත්‍රික් දෙකක් වන පොළොන්නරුව හා මහනුවර නිෂ්පාදන පිරිවැය සැසඳීමේ දී චාරිත්‍ර තබා ගත් ගොවීන් අතර සම්පත් උපයෝගී කර ගැනීමේ රටාවෙහි වෙනස්කම් තිබෙන බව පෙනින.

පෙරදී දැක්වූ ලෙස (සටහන් I-2) මහනුවර අක්කරයකට උපයෝගී කරගත් මුළු මිනිස් දින ගණන දිස්ත්‍රික්ක පහේ උපරිම ප්‍රමාණය වූ අතර පොළොන්නරුවේ දින ගණනට වඩා දින 25 කින් වැඩි විය. මහනුවර මුළු ශ්‍රම යෙදවුම වැඩි වීමට මූලික වශයෙන් හේතු වූයේ පවුල් සහ අත්තම් ශ්‍රමය වැඩිපුර උපයෝගී කර ගැනීමය. කෙසේ වෙතත් මහනුවර අක්කරයකට උපයෝගී කරගත් ශ්‍රමයෙහි පිරිවැය පොළොන්නරුව ශ්‍රම පිරිවැයට වඩා වැඩි වූයේ සියයට 14 කින් පමණකි. (සටහන II-1)

අනික් අතට පොළොන්නරුවේ උපයෝගී කරගත් ට්‍රැක්ටර් දින ගණන මහනුවර ට්‍රැක්ටර් දින ගණන මෙන් හරියටම දෙගුණයකි. එහෙත් පොළොන්නරුවේ ට්‍රැක්ටර් දින ගණනෙහි පිරිවැය මහනුවර ට්‍රැක්ටර් දින ගණනෙහි පිරිවැයට වඩා වැඩි වන්නේ සියයට 13 කිනි. වැටුප් ප්‍රමාණ හා ට්‍රැක්ටර් කුලී ගාස්තු දිස්ත්‍රික් දෙකෙහි වෙනස් වීම නිසා ප්‍රදේශ දෙකෙහි අක්කරයක උපයෝගී කර ගන්නා ලද යෙදවුම් පිළිබඳ පිරිවැය වෙනස්කම් යෙදවුම් ප්‍රමාණයන්ගේ වෙනස් කම්වලට අනුරූප ලෙස නොවෙනස් වූහයි සිතනු ලැබේ. දිස්ත්‍රික්ක දෙකෙහි ඵලදාවන්හී වෙනස්කම් නොසලකා හැරීමට තරම් සුළුය. මහනුවර ඵලදාවට වඩා පොළොන්නරුවේ ඵලදාව වැඩි වූයේ බුසල් 4 කින් පමණි. (සටහන I-1.)

සටහන II-2. අක්කරයක ලාභ ආන්තිකයන් සහ ගොවි පවුලේ ඉපැයුම්

| | අක්කරයකට ලබා ගත් වී අස්වැන්නේ මුළු වටිනාකම (අ) | අක්කරයක මුළු පිරිවැය (ආ) | අක්කරයක ලාභ ආන්තිකය (ඇ) | අක්කරයක පවුල් හා අත්තම් තක්සේරු අගය (ඈ) | අක්කරයක ගොවි පවුල් ඉපැයීම (ඉ) |
|---|---|---|---|---|---|
| හම්බන්තොට | 516.60 | 532.19- | 15.59 | 41.83 | 26.24 |
| පොළොන්නරුව | 1,061.20 | 733.05 | 328.15 | 51.02 | 379.17 |
| කුරුණෑගල | 698.60 | 630.57 | 68.03 | 47.73 | 115.76 |
| මහනුවර | 1,003.80 | 702.21 | 301.59 | 150.65 | 452.24 |
| කොළඹ | 645.40 | 538.86 | 106.54 | 79.27 | 185.81 |

සටහන්: 1. අක්කරයක ලාභ ආන්තිකය - (අ) - (ආ)

2. මෙම සටහනේ අත්තම් සහ පවුල් ශ්‍රමය පිළිබඳ තක්සේරු අගයන් සටහන් II - 1 සිට ගෙන එන ලදී.

3. අක්කරයක ගොවි පවුල් ඉපැයුම් (ඉ) - (ඇ + ඈ)

අක්කරයකට යෙදූ බීජ වී, පොහොර, කෘෂි රසායන සහ අන්‍ය විවිධ යෙදවුම්වල පිරිවැය චාරිත්‍ර පොත් වලින් නිමානය කරන ලදී.

මෙම දිස්ත්‍රික්ක දෙකෙහි චාරිත්‍ර තබා ගත් ගොවීන් අක්කරයකට ලබා ගත් ලාභ ආන්තිකයන් බොහෝ සෙයින් එක සමාන වෙයි. (සටහන් II-2) පවුලේ ශ්‍රමය වඩා සියුම් ලෙස යොදා ගත් නිසා මහනුවර ගොවි පවුලක් අක්කරයකට ලබා ගත් ඉපැයීම් පොළොන්නරුවේ ගොවි පවුලක ඉපැයීම්වලට වඩා සාපේක්ෂ ලෙස වැඩි විය. අප අධ්‍යයනය කළ කන්නයෙහි හම්බන්තොට අක්කරයක ලාභ ආන්තිකය සෘණ ස්වභාවයක් ගත්තේ මූලික වශයෙන්, එකල පැවැති අයහපත් කාලගුණ තත්වයන් නිසා ඉතා අඩු වලදාවක් ලැබුණ හෙයිනි. කුරුණෑගල සහ මහනුවර ද ලැබුණු ලාභ ආන්තිකයන් සුළු විය. ඊට හේතු වූයේ සාපේක්ෂක ලෙස අඩු වලදාවක් ලැබීමය.

සටහන II - 3

දිස්ත්‍රික්ක පහේ චාරිත්‍ර තබාගත් ගොවීන් අනුගමනය කළ වගා පුරුදු

| | වතුර ගත කරන චාරිත්‍ර තබා ගත් ගොවීන් ගේ සංඛ්‍යාව | කෙළින්ම වැපිරීම කළ ගොවීන් ගේ ගණන | ගොයම් සිටවූ ගොවීන්ගේ ගණන | පොහොර නොයෙදූ ගොවීන්ගේ ගණන | කෘෂි රසායන නොයෙදූ ගොවීන්ගේ ගණන |
|---|---|---|---|---|---|
| හම්බන්තොට | 9 | 8 | 1 | - | - |
| පොළොන්නරුව | 16 | 12 | 4 | - | 6 |
| කුරුණෑගල | 14 | 10 | 4 | 4 | 3 |
| මහනුවර | 24 | 2 | 22 | 2 | 5 |
| කොළඹ | 22 | 19 | 3 | 1 | 5 |

වගා පුරුදු සලකා බලන කල (සටහන II-3) පොළොන්නරුව හා හම්බන්තොට දිස්ත්‍රික්ක දෙකෙහි චාරිත්‍ර තබා ගත් ගොවීන් පොහොර භාවිතා කර ඇති බව පෙනේ. කෙසේ වෙතත් මෙම දිස්ත්‍රික්ක දෙකෙහිම භාවිතා කර තිබුනේ නිර්දේශිත ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයකි. අවම පොහොර භාවිතය කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි විය. කුරුණෑගල දිස්ත්‍රික්කයේ චාරිත්‍ර තබා ගත් ගොවීන් 14 දෙනාගෙන් 4 දෙනෙකු කිසිම පොහොර වර්ගයක් භාවිතා නොකළ බව නොසලකා හැරිය ද අන්‍ය ගොවීන් විසින් භාවිතා කරන ලද පොහොර ප්‍රමාණයන් නියමිත ප්‍රමාණයන්ට වඩා ඉතා අඩුය. මෙම කරුණ, දිස්ත්‍රික්කයේ ව්‍යාප්ති නිලධාරීන්ගේ සැලකිල්ලට යොමු වීම සහ පොහොර භාවිතය ක්‍රමයෙන් වැඩි කිරීමට ගන්නාවූ පියවරවල් තවත් තීව්‍ර කිරීමට උත්සාහ ගැනීම මැනවි. මහනුවර චාරිත්‍ර තබා ගත් ගොවීන්ගෙන් සියයට 90 කට වැඩි පිරිසක් ගොයම් සිටවීම කළ නමුත් අන්‍ය සෑම දිස්ත්‍රික්කයකම පොදු වගා පිළිවෙත වූයේ වී වැපිරීමය.

සටහන II-4

අක්කරයකට යොදන ලද යෙදවුම්වල පිරිවැය සංරචකයන් (රුපියල්)

| | | | | | |
|---|---|---|---|---|---|
| හම්බන්තොට | 40.97 | 53.61 | 30.11 | 11.50 | 136.19 |
| පොළොන්නරුව | 32.16 | 65.61 | 27.85 | 19.99 | 145.61 |
| කුරුණෑගල | 28.77 | 37.14 | 15.56 | 22.96 | 104.43 |
| මහනුවර | 21.26 | 51.04 | 16.04 | 18.47 | 106.81 |
| කොළඹ | 27.08 | 52.39 | 11.14 | 24.39 | 115.00 |

ගොවිතැන් කිරීමට උපයෝගී කර ගන්නා ලද වගා පිළිවෙත් අනුව භාවිතා කළ යෙදවුම් සාමාන්‍ය පිරිවැය දිස්ත්‍රික්ක පහේදී විවිධ විය. (සටහන II-4) දිස්ත්‍රික්ක පහේට උපයෝගී කර ගන්නා ලද යෙදවුම් වලින් මිල අධිකතම කාරණය වූයේ පොහොරය. රළඟට බීත්තර වීය. පොළොන්නරුවේ හැර අන් ප්‍රදේශවල අක්කරයකට යොදන ලද පොහොරවල සාමාන්‍ය පිරිවැය නිර්දේශ කරන ලද පොහොර ප්‍රමාණයන්ගේ පිරිවැයට වඩා සාරානුකූලව අඩු වෙයි. පොළොන්නරුව දිස්ත්‍රික්කයෙහි වුවද අක්කරයකට යොදන ලද පොහොර ප්‍රමාණයේ සාමාන්‍ය වියදම නිර්දේශිත ප්‍රමාණයේ මිලට වඩා අඩු වෙයි.1/

පැල සිටුවීමට උපයෝගී කරගත් ක්‍රම අනුව, අක්කරයක් සඳහා උපයෝගී කර ගන්නා ලද බීජ වීවල සාමාන්‍ය පිරිවැය ද ඒ ඒ දිස්ත්‍රික්කයේදී වෙනස් විය. ගොයම් සිටුවීමේ ක්‍රමය උපයෝගී කර ගත් මහනුවර, බීජ වී සඳහා වියදම් කළ මුදල දිස්ත්‍රික්ක පහෙන්ම අවම මුදල විය. යල කන්නයෙහි පැවති උග්‍ර නියඟය නිසා හම්බන්තොට සටහර ගොවියෝ තම කුඹුරු නැවත වගා කළ නිසා හම්බන්තොට බීජ වී පිරිවැය අසමාන ලෙස අධික විය. කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය ගැන සළකා බලනවිට තෙත් කලාපයේ දිස්ත්‍රික්කවලට වඩා සෑහෙන පමණ වැඩි වියදමක් හම්බන්තොට සහ පොළොන්නරුව ගොවීහු දරා ඇත. අක්කරයකට උපයෝගී කර ගන්නා ලද යෙදවුම් ද්‍රව්‍යයන් සඳහා වියලි කලාපයේ ගොවීන් විසින් දරන ලද වියදම තෙත් කලාපයේ ගොවීන්ගේ වියදමට වඩා සාපේක්ෂ ලෙස වැඩි බව සටහන II-4 දක්වයි.

### III බුසලක නිෂ්පාදන පිරිවැය සහ අන්තර් දිස්ත්‍රික්ක පිරිවැය - ඵලදා සම්බන්ධතාව

වී බුසලක නිෂ්පාදන පිරිවැය සටහන II-1 දක්වා ඇති අක්කරයක් සඳහා වූ නිෂ්පාදන පිරිවැය මගින් නිමානය කරන ලදී. අපේක්ෂා කරන ලද පරිදිම වී බුසලක නිෂ්පාදන පිරිවැය සහ අනුරූප අක්කරයක ඵලදාව අතර ඍජු සම්බන්ධතාවයක් දක්නට ලැබින.

---

1/ පොළොන්නරුව දිස්ත්‍රික්කයෙහි අක්කරයක් සඳහා නිර්දේශ කරන ලද පොහොර ප්‍රමාණයේ මිල රු. 80.00 කි.

සටහන III – I

1972 යල කන්නයෙහි වී බුසලක නිෂ්පාදන පිරිවැය (රුපියල්)

| | ශ්‍රමය | පී හරක් | ට්‍රැක්ටර් ද්‍රව්‍ය | යෙදවුම් | බුසලක මුළු පිරිවැය | අක්කරයක එලදාව බුසල් |
|---|---|---|---|---|---|---|
| හම්බන්තොට | 17.38 | 0.15 | 3.21 | 3.69 | 14.43 | 36.9 |
| පොළොන්නරුව | 5.32 | 0.45 | 1.98 | 1.92 | 9.67 | 75.8 |
| කුරුණෑගල | 8.10 | 0.48 | 1.96 | 2.09 | 12.64 | 49.9 |
| මහනුවර | 6.74 | 0.86 | 0.71 | 1.49 | 9.80 | 71.7 |
| කොළඹ | 6.99 | 0.87 | 1.27 | 2.50 | 11.68 | 46.1 |

දිස්ත්‍රික්ක පහේ වාර්තා තබා ගත් ගොවීන් වී බුසලක් නිෂ්පාදනය කිරීමට වැය කළ වියදම් සටහන III – I හි දක්වා ඇත. මෙම සටහන අනුව වැඩිම පිරිවැය හම්බන්තොට ද අවම පිරිවැය පොළොන්නරුවේ ද දක්නට ලැබින.

මහනුවර ගොවීන් නිෂ්පාදනය කළ වී බුසලක වියදම පොළොන්නරුවේ ගොවීන්ගේ වියදමට සමානය. මහනුවර ගොවීන් වී බුසලක් නිෂ්පාදනය කිරීමේදී දැරූ ශ්‍රම පිරිවැය පොළොන්නරුව හැර අන්‍ය දිස්ත්‍රික්කවලට වඩා අඩු වීම සැලකිය යුතු කරුණකි; සටහන් II – I හි දක්වා ඇති පරිදි මහනුවර අක්කරයකට උපයෝගී කර ගන්නා ලද මුළු ශ්‍රම පිරිවැය අන්‍ය දිස්ත්‍රික්කවලට වඩා වැඩි හෙයිනි. වී බුසලක් නිෂ්පාදනය කිරීමේදී ශ්‍රම පිරිවැය අඩු වූයේ මූලික වශයෙන් කරුණු දෙකක් නිසාය. එනම් අක්කරයකින් වැඩි එලදාවක් ලැබීම සහ මහනුවර දිස්ත්‍රික්කයේ ගෙවන ලද වැටුප් ප්‍රමාණයන් සාපේක්ෂ ලෙස පහළ මට්ටමක වීමය.

මෙම සටහනේ දැක්වෙන වී බුසලක පිරිවැය සහ අක්කරයක වී එලදාව උපයෝගී කරගෙන පහත දැක්වෙන අන්තර් දිස්ත්‍රික්ක පිරිවැය ශ්‍රිතය නිෂ්පන්න කෙරින.

$$\text{වී} = 17.929 - \underset{(0.023)}{0.112}\ \text{අ} \qquad (r^2 = 0.891)$$

මෙහි "වී" යන්නෙන් වූ බුසලක නිෂ්පාදන පිරිවැය රුපියල් වලින් වේ. "අ" යන්නෙන් අක්කරයක අනුරූප එලදාව බුසල් වලින් දැක්වෙයි. සංගුණකය ( ) 0.891 වීමත් ප්‍රතිපායන සංගුණකයේ නියැදි දෝෂය කුඩා වීමත් (0.023) නිසා නිෂ්පන්න කරන ලද අන්තර් දිස්ත්‍රික්ක පිරිවැය ශ්‍රිතය සංඛ්‍යානමය වශයෙන් වැදගත් වෙයි.

III–2 නිෂ්පන්න සමීකරණයෙන් තක්සේරු කරන ලද වී බුසලක පිරිවැය – යල 1972

| එලදාව | තක්සේරු කරන ලද බුසල | නියම පිරිවැය | බුසලක මිල | බුසලක ලාභ අාන්තිකය තක්සේරු | බුසලක ලාභ අාන්තිකය නියම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 30 | 14.57 | ලැබී නැත | 14.00 | – 0.57 | ලැබී නැත |
| 35.0 | 14.01 | ලැබී නැත | 14.00 | – 0.01 | ලැබී නැත |
| 36.9 හම්බන්තොට | 13.80 | 14.43 | 14.00 | – 0.20 | – 0.43 |
| 40.0 | 13.45 | ලැබී නැත | 14.00 | 0.55 | ලැබී නැත |
| 45.0 | 12.89 | ලැබී නැත | 14.00 | 1.11 | ලැබී නැත |
| 46.1 කොළඹ | 12.77 | 11.68 | 14.00 | 1.23 | 2.32 |
| 49.9 කුරුණෑගල | 12.43 | 12.65 | 14.00 | 1.57 | 1.35 |
| 50.0 | 12.33 | ලැබී නැත | 14.00 | 1.67 | ලැබී නැත |
| 55.0 | 11.77 | ලැබී නැත | 14.00 | 2.23 | ලැබී නැත |
| 60.0 | 11.21 | ලැබී නැත | 14.00 | 2.79 | ලැබී නැත |
| 65.0 | 10.65 | ලැබී නැත | 14.00 | 3.35 | ලැබී නැත |
| 70.0 | 10.09 | ලැබී නැත | 14.00 | 3.91 | ලැබී නැත |
| 71.7 මහනුවර | 9.90 | 9.80 | 14.00 | 4.10 | 4.20 |
| 75.0 | 9.53 | ලැබී නැත | 14.00 | 4.47 | ලැබී නැත |
| 75.8 පොළොන්නරුව | 9.44 | 9.67 | 14.00 | 4.56 | 4.33 |
| 80.0 | 8.97 | ලැබී නැත | 14.00 | 5.03 | ලැබී නැත |
| 85.0 | 8.41 | ලැබී නැත | 14.00 | 5.59 | ලැබී නැත |

මෙම අන්තර් දිස්ත්‍රික්ක පිරිවැය ශ්‍රිතය උපයෝගී කරගෙන සටහන III–2. හි දැක්වෙන පරිදි නියමිත අක්කරයක එලදාවට අනුරූපව බුසලක පිරිවැය තක්සේරු කරන ලදී. තක්සේරු පිරිවැය සහ දිස්ත්‍රික්ක පහේ වාර්තා පොත් වලින් ලබා ගත් නියම පිරිවැය අතර වෙනස සැලකිය යුතු පමණ සුළු විය. සටහන III–2 හි පෙනෙන පරිදි 1972 යල කන්නයෙහි අක්කරයක එලදාව බුසල් 35 ක් වූ විට බුසලක නිෂ්පාදන පිරිවැය රු. 14.00 ක් විය. බුසලක පිරිවැය සහ අක්කරයක එලදාව අතර ඉහත දැක්වෙන සම්බන්ධතාව උපයෝගී කරගෙන, පහත දැක්වෙන ප්‍රවණතාව නිරීක්ෂණය කරන ලදී.

1973 පෙබරවාරි මාසයේදී සහතික මිල ක්‍රමය යටතේ වීවල මිල රු. 14.00 සිට රු. 18.00 දක්වා වැඩි කරන ලදී. වී මිල වැඩි කළ කාලයේදී සාමාන්‍ය මිල දර්ශකය සියයට 25 කින් ඉහළ ගිය බව මිල තක්සේරු වලින් පෙනේ. මෙම වෙනස් වූ මිල තත්වය පිරිවැය ශ්‍රිතයෙහි උපයෝගී කර ගන්නේ නම් පහත දැක්වෙන පරිදි වූ බුසලක පිරිවැය රු. 18.00 වනු ඇත. මෙම ගණන වර්තමාන වී සහතික මිලට සමානය:

$$1.25\ (17.929 - 0.112\ අ) = 18.00$$

